www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: දෙමල ජනයාට කිසිදු සහනයක් දීමට ජවිපෙ දැඩි ලෙස විරුද්ධ වෙයි

## Sri Lanka: JVP vehemently opposes any concessions to Tamils

**විජේ ඩයස් විසිනි**
**2008 ජූනි 11**

පසුගිය බ්‍රහස්පතින්දා පැවැත්වූ කතාවක දී, විපාර්ශ්වික ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නායක සෝමවංශ අමරසිංහ, දිවයිනේ දෙමල සුලුතරයට සහන දීම මගින් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව හමුදාව ලත් ජයග්‍රහන "පාවා" නොදෙන ලෙස ශ්‍රී ලංකා ආන්ඩුවට දැඩි ලෙස අනතුරු ඇඟවීය.

ශ්‍රී ලංකා රාජ්‍යයේ සිංහල අධිපතිවාදී ස්වභාවය වෙනස් කිරීමේ බිංදු මාත්‍රයක හෝ අභිප්‍රායක් ජනාධිපති මහින්ද රාජපක්ෂට නැත. එල්ටීටීඊයට එරෙහි දිග්ගැසුනු සිවිල් යුද්ධය ගෙන ගියේ එම තත්වය ආරක්ෂා කරගැනීම සඳහා ය. දිවයිනේ උතුරට හා නැගෙනහිරට යම් ආකාරයක බලය බෙදීමක් ඇතුලත් "දේශපාලන විසඳුමක්" සඳහා ඔහු කරන අපැහැදිලි කැඳවුම්වල එල්ලය වන්නේ, දෙමල ජනයාට අව්‍යාජ ප්‍රජාතන්ත්‍ර අයිතීන් සම්පාදනය කිරීම නොව, දෙමල ප්‍රභූ කොටස්වල සහයෝගය සහතික කරගැනීම ය.

ජවිපෙ 2005 දී රාජපක්ෂගේ මැතිවරන ජයග්‍රහනයට පිටුබලය සැපයූ අතර, ආකාරගතව විපාර්ශ්වයේ රැඳී සිටිමින්, ඔහුගේ යලි ඇරඹූ යුද්ධයට මුලුමනින්ම සහාය දුන්නේ ය. යුද්ධය යලි ඇරඹීම මගින්, රාජපක්ෂ තථ්‍ය වසයෙන් ජවිපෙ සිංහල ස්වෝත්තමවාදී පූච්චානම් බොහෝ සෙයින් සියතට ගත්තේ ය. ජවිපෙ ආන්ඩුවේ දැවැන්ත යුද අයවැයවලට සහාය දුන් අතර කම්කරු අරගල යුද ප්‍රයත්නය අනතුරේ හෙලන බවට රාජපක්ෂ ප්‍රකාශ කල විට, ජවිපෙ වෘත්තීය සමිති එවන් කම්කරු අරගල යලියලිත් කඩාකප්පල් කලේ ය. දැන්, හමුදාවේ ජයග්‍රහනවලින් වාසි ලබාගනු පිනිස ජනාධිපතිගේ යුදවාදී වර්ගෝත්තමවාදී වාචාලත්වය ඉක්මවා යාමට ප්‍රයත්න දරමින්, සිය වියැකෙන සහයෝගී පදනම් වර්ධනය කරගැනීමේ උත්සාහයක ජවිපෙ යෙදී සිටී.

පසුගිය සතියේ ජවිපෙ රැස්වීමේ දී අමරසිංහ මෙසේ පැවසීය: "මේ ආරක්ෂක හමුදාවේ වැඩේ අපට කරන්න බැහැ. ඒත් යුද ජයග්‍රහන මගින් නිර්මානය කෙරුනු අවස්ථාව නොතකා හරිමින් ජාතිය පාවා දෙන්න ආන්ඩුව දිගටම කටයුතු කලොත් ආන්ඩුවට විරුද්ධව යුද වදින්න අපට බල කෙරෙනවා." එල්ටීටීඊය හරහා ශ්‍රී ලංකාවට එරෙහිව රහස් යුද්ධයක් ගෙන ගිය බවට ඉන්දියාවට පහර ගැසීමෙන් පසුව ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය: "ආන්ඩුව ඉන්දියාවට යටත් වෙලා 13 වැනි සංශෝධනයට එහා යන පදනමක් උඩ බලය බෙදන්න සූදානම් වෙනවා." ජවිපෙ එය සිඳු වීමට ඉඩ නොදෙන බවට අමරසිංහ අනතුරු ඇඟවීය.

ඉන්දියානු විරෝධී ස්වෝත්තමවාදය, සිංහල අධිපතිවාදී මතවාදයේ කේන්ද්‍රීය අංගයක් ලෙස නිරතුරුවම පැවතුනි. මාඕවාදයේ, ගුවේරාවාදයේ හා සිංහල ස්වෝත්තමවාදයේ සාරසංග්‍රහවාදී මිශ්‍රනයක පදනම මත 1960 ගනන්වල පිහිටුවන ලද ජවිපෙ, දෙමල ජනයා "ඉන්දියානු අධිරාජ්‍යවාදයේ" පස්වන කොලම ලෙස හෙලා දුටුවේ ය. දකුනු ඉන්දියාවේ දෙමල ජනයාගෙන් එල්ල වුනු පීඩනය යටතේ, ඉන්දියාව ආරම්භයේ දී එල්ටීටීඊයට හා සෙසු දෙමල බෙදුම්වාදී කන්ඩායම්වලට යම් සහයෝගයක් දුන් අතර, එහෙත් එල්ටීටීඊයේ අරගලය ඉන්දියාව තුල බෙදුම්වාදී මනෝගතීන් ඇවිලවීමේ තර්ජනය මතු කල විට ඔවුන්ට එරෙහිව ඉක්මනින්ම හැරී ගත්තේ ය.

1987 දී, එල්ටීටීඊයේ ගරිල්ලා යුද්ධය පැතිරෙන විට, "ඉන්දු-ලංකා" ගිවිසුම අත්සන් කිරීම හා එල්ටීටීඊය නිරායුධ කරනු වස් දිවයිනේ උතුරට සාම-සාධක හමුදා එවීම මගින්, ඉන්දියාව ශ්‍රී ලංකා ආන්ඩුවේ සහායට පැමිනියේ ය. එම අවස්ථාවේ දී, ඉන්දියානු මැදිහත්වීමට ද උතුරේ හා නැගෙනහිර පලාත් සභාවලට සීමිත බලයක් බෙදා දුන් 13 වන ව්‍යවස්ථා සංශෝධනයට ද එරෙහිව "ජාතිය ආරක්ෂා කිරීමේ" ප්‍රතිගාමී උද්ඝෝෂනයක ජවිපෙ යෙදී ගති.

ජවිපෙ ෆැසිස්ට් කල්ලි, තම දේශප්‍රේමී ඉල්ලීම්වලට සහයෝගය දීම ප්‍රතික්ෂේප කල දේශපාලන විරුද්ධවාදීන්, වෘත්තීය සාංගමිකයන් හා කම්කරුවන් සිය ගනනක් ඝාතනය කලහ. ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධ වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ, එනම් සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමී සංවිධානයේ,

සාමාජිකයන් තිදෙනෙක් ද ජවිපෙ තුවක්කුකරුවන් විසින් මරා දමන ලදි.

1990 ගනන්වල දී, ජවිපෙ සිය "සන්නද්ධ අරගලය" ආකාරගත ලෙස අවසන් කල අතර, ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙකට -- එක්සත් ජාතික පක්ෂයට (එජාප) හා රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) -- එරෙහිව නැගෙන විරුද්ධත්වය පාලනය කිරීමේ ප්‍රයෝජනවත් දේශපාලන ආරක්ෂක කපාටයක් ලෙස ජවිපෙ දේශපාලන ප්‍රධාන ප්‍රවාහය තුලට සාදරයෙන් පිලිගන්නා ලදි. සිය සමාජවාදී වාග් පාඨ හඬතැලීම් මුලුමනින්ම පාහේ අතහැර ඇති ජවිපෙ, කම්කරුවන්ගේ හා දුගීන්ගේ පැත්තේ සිටින බවට තවමත් මවා පෙන්වන ගමන් ම, කම්කරු පන්තියේ සමාජ තත්වයට තව දුරටත් පහර එල්ල කල ශ්‍රීලනිප නායකත්වයෙන් යුක්ත 2004 සභාග ආන්ඩුවට සම්බන්ධ විය.

අමරසිංහ ඉන්දියානු විරෝධී වාචාලත්වයට යලි පන දීම, තරමක් දුරට, ජවිපෙ කඩාවැටෙන අවස්ථාවන්ට යලි පනදීමේ මංමුලා සහගත ප්‍රයත්නයකි. එය විශේෂයෙන් ම යොමු කෙරෙන්නේ, යුද ගැටුම්වලට කොටු වී සිටි ලක්ෂ සංඛ්‍යාත දෙමල සිවිල් ජනයාගේ ඉරනම ලිහිල් කරනු වස් සටන් විරාමයක් සඳහා ඉන්දියාව කල සීමිත කැඳවුම් කෙරහි දරුනු ලෙස උරන වී සිටි, මිලිටරිය හා රාජ්‍ය යන්ත්‍රය තුල සිටින කොටස් ඇතුලු, අතිශයින්ම ආන්තික සිංහල ස්වෝත්තමවාදී ස්ථර වෙත ය. යථා වසයෙන් ගත් කල, නව දිල්ලිය මිලිටරි උපකරන, පුහුනුව හා ඔත්තු තොරතුරු සම්පාදනය කරමින්, රාජපක්ෂගේ සාපරාධී යුද්ධයට පූර්න සහයෝගය දුන්නේ ය.

උතුරට හා නැගෙනහිරට බලය විමධ්‍යගත කිරීමේ මොන යම් හෝ ප්‍රයත්නයක් හෙලාදැකීමේ අමරසිංහගේ පිලිවෙත ආයාචනා කරන්නේ, සිය දෙමල සගයන් වෙත මොන යම් හෝ සහනයක් දීමට දැඩි ලෙස විරුද්ධ වන සිංහල පාලක ප්‍රභූවේ එම ස්ථර වෙත ය. මැයි 27 දා නිකුත් කල "ජාතිය ඉදිරියට ගෙන යාමේ " සිය කරුනු 14කින් යුක්ත වැඩපිලිවෙල තුල, ජවිපෙ තවත් දුර ගමන් කරමින්, "ජාතික ගැටලුව" විසඳීම පිනිස සර්ව පාක්ෂික නියෝජිත කමිටුව ඉදිරිපත් කර ඇති බොරු සැරසිලි සහගත යෝජනාවලිය පවා ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටී.

ජවිපෙ වැඩපිලිවෙල, "ජාතික සමගියේ" හා "සියලු පුරවැසියන් සඳහා සමාන අවස්ථා" සැලසීමේ නාමයෙන් "පලාත් සභාවලට පොලිස්, ඉඩම්, මූල්‍ය සහ තවත් බලතල ප්‍රදානය කරන බලය බෙදාහැරීමේ සියලු යෝජනා" ප්‍රතික්ෂේප කලේ ය. ආන්ඩුවේ ප්‍රකාශවල ඇති මෙම ආරම්භයේ සඳහන් කල වදන්වලින් සරලවම අදහස් කෙරෙන්නේ, පවත්නා තත්වය ද දශක ගනනාවක් තිස්සේ අනුප්‍රාප්තික කොලඹ ආන්ඩු විසින් ගොඩනගන ලද හා පලමු කොටම යුද්ධය සඳහා තුඩු දුන් ක්‍රමානුකූලව දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙත ද පවත්වා ගෙන යාමයි.

මිලිටරි නායකත්වයට කෙරෙන ඍජු ආයාචනයක් ලෙස, අමරසිංහ, හමුදාවේ ඉවබවක් නැති ෂෙල් ප්‍රහාර මගින් යුද්ධයේ අවසන් මාස කිහිපය තුල දෙමල සිවිල් වැසියන් දහස් ගනනක් ඝාතනයට ලක් වීම සම්බන්ධයෙන් යුද අපරාධ පිලිබඳ පරීක්ෂනයක් පවත්වන ලෙස කෙරෙන ජාත්‍යන්තර කැඳවුම් හෙලා දුටුවේ ය. "කිසිම ආන්ඩුවේ හෝ හමුදාවේ නිලධාරියෙක් යුද අධිකරනයට ගෙනියනවා නම් එසේ ගෙන යාමට සිදුවන්නේ ජවිපෙ අපේ මල කඳන් උඩිනුයි" යයි ඔහු පැවසී ය.

රාජපක්ෂ ආන්ඩුවේ ජයග්‍රහන සැමරීමේ උත්සව විවේචනය කරමින්, අමරසිංහ මෙසේ ප්‍රකාශ කලේ ය: "එල්ටීටීඊය පරාද කරන්න උර දුන් අය බොහෝ දෙනෙක් අමතක කරලා, . . . පකිස්තානය, චීනය හා ඉරානය වගේ මිත්‍ර රටවල්වල දායකත්වය අමතක කරලා," චීනයට කරන සැඳහුම විශේෂයෙන් ම අර්ථභාරී වන්නේ, ජවිපෙ ස්ටැලින්වාදී චීන කොමියුනිස්ට් පක්ෂය සමග තවමත් සබඳතා පවත්වමින් චීනයේ ලාභ ශ්‍රම වේදිකාව ශ්‍රී ලංකාව සඳහා ආදර්ශයක් ලෙස සඳහන් කරන බැවිනි. රාජපක්ෂ ආන්ඩුවට ආයුධ හා මූල්‍ය ආධාර ලබා දුන් චීනය, ඉන්දියාව ඇතුලු, සිය ප්‍රතිවාදීන් අභිබවමින් කොලඹ මත සිය දේශපාලන ආනුභාවය වර්ධනය කරගනු වස් යුද්ධය සඳහා තමන් පුදන කොන්දේසි විරහිත සහයෝගය යොදා ගැනීමට දැන් උත්සාහ කරයි.

එම රැස්වීමේ දී ම කතා කරමින්, ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සඳහා සිය පක්ෂය දෙන සහයෝගය ගැන පුරසාරම් දෙඩී ය. "ත්‍රස්තවාදයට" එරෙහි යුද්ධය පිලිබඳව පිටු 100ක ග්‍රන්ථයක් රචනා කල හොත්, ආන්ඩුවේ නම් සඳහන් වනු ඇත්තේ 75 වන පිටුවේ පමනක් යයි ඔහු පැවසී ය. ජවිපෙට ත්‍රස්තවාදය පිලිබඳව පැහැදිලි මතවාදයක් සැමදාම තිබුනු බවත් පක්ෂය එහි ආරම්භයේ ම පටන් බෙඳුම්වාදී අරගලයට එරෙහිව සටන් වැද ඇති බවත් ඔහු සඳහන් කලේ ය.

දක්ෂිනාංශික අයිලන්ඩ් පුවත්පතේ අගහරුවාදා පල වූ කතුවැකියක්, හමුදාවේ ජයග්‍රහනයෙන් අනතුරුව රාජපක්ෂ අමරසිංහට දුන් දුරකතන ඇමතුම "ජවිපෙ මහන්තත්වය දැවැන්ත ලෙස පුම්බාලන්ට" ඇතැයි ප්‍රකාශ කරමින්, ආන්ඩුව අස්ථාවර කිරීමට එරෙහිව ජවිපෙට අනතුරු ඇඟවී ය. ජයග්‍රහනය, "සියලු ජන කන්ඩායම්වලට පිලිගත හැකි ශක්‍ය දේශපාලන ප්‍රතිකාරයක් සොයාගැනීමට" රාජපක්ෂට අවස්ථාවක් සලසා ඇතැයි ප්‍රකාශ කරමින්, කතුවැකිය මෙසේ

අනතුරු ඇඟවී යː "මේ අවස්ථාවේ ඔහුට බාධා කිරීම ගැටුම මුලුමනින්ම අමතකර කර දැමීමේ ශ්‍රී ලංකාවේ අවස්ථාවන් විනාශ කිරීමකි."

අයිලන්ඩ් කතා කරන්නේ, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ අනාරක්ෂිත තත්වය පිලිබඳව මැනවින් දන්නා සහ කම්කරුවන්ගේ හා නාගරික හා ගම්බද දුගීන්ගේ ජීවන තත්වයන් මත මූලික ප්‍රහාරයක් එල්ල කරන පිලිවෙත් ඉදිරියට ගෙන යන ලෙස රාජපක්ෂට බල කරන, පාලක ප්‍රභූවේ ස්ථර වෙනුවෙනි. රාජපක්ෂ සම්බන්ධයෙන් එයට පවත්නා උත්සුකතාව වන්නේ, ඔහුගේ සභාග ආන්ඩුව වැඩ කරන ජනතාව මත නව ආර්ථික බරබද්දල් කඩාපාත් කිරීමට උත්සාහ කරන විට එයට පවත්නා සහයෝගී පදනම් ශීඝ්‍රයෙන් වියැකී යා හැකි බව හඳුනාගැනීමකි. ජවිපෙ ජනතාවාදී උද්ඝෝෂන එම සමාජ අසහනය දිරිගන්වනු ඇතැයි පුවත්පත බියට පත්ව ඇත.

ජවිපෙ කරුනු 14කින් යුක්ත වැඩපිලිවෙල, ඇමැති මන්ඩලයේ ප්‍රමානය අඩු කරන ලෙස කැඳවුම් කරන අතර, දූෂන චෝදනාවන්ට ලක් වූ ඇමතිවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ ඉහල නිලධාරින් අධිකරනය ඉදිරියට පමුනුවන ලෙස ඉල්ලා සිටී. පුද්ගලීකරනයත් ජාතික සම්පත් විකිනීමත් නතර කරන ලෙස ඉල්ලා සිටිමින්, එය ආර්ථික ජාතිකවාදයේ පරාගතවාදී ඉදිරිදර්ශනයට ආයාචනා කරයි. කෙසේ වෙතත්, අර්ථභාරී කරුන නම්, එම වැඩපිලිවෙල, කම්කරු පන්තියේ ජීවන තත්වයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මොන යම් සැඳහුමක් හෝ යුද්ධය තුල දී බිලි දුන් වැටුප්, සමාජ සේවාවන් හා මිල සහනාධාර පුනස්ථාපනය කරන ලෙස ඉල්ලීමක් හෝ කරන්නේ නැත යන්නයි.

ජවිපෙ දිශාවනතියේ වඩාත්ම නරුම අංගය නම්, එය හමුදාවේ යුද අපරාධ දැඩි ලෙස ආරක්ෂා කිරීමයි. ජවිපෙ ඉන්දියානු විරෝධී හා දෙමල විරෝධී පූච්චානම්වල එල්ලය වන්නේ, ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්වටල විරුද්ධ වන කම්කරුවන්ට, ශිෂ්‍යයන්ට හා ගොවීන්ට එරෙහිව පොලිස්-රාජ්‍ය විධික්‍රම යොදා ගැනීමට නොපැකිලෙනු ඇති කොලඹ සංස්ථාපිතයේ වඩාත්ම ප්‍රතිගාමී කොටස් සමග හාදවීමයි. ජවිපෙ "රට ඉදිරියට ගෙන යන" එවන් විධික්‍රමවලට තමන් සහයෝගය දෙන බව සංඥා කරමින් අවශ්‍ය නම් සිය සේවය ලබා දීමට ඉදිරිපත් වෙයි.

© www.wsws.org